# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2353/53 - 2023 ඔක්තෝබර් මස 11 වැනි බදාදා - 2023.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය : 4645

විශේෂ්‍ය අංකය : මහ/60

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

මාඩුගොඩ, මාලිගා වලව්ව හි පදිංචි ඒකනායක රාජපක්ෂ නිසිවාසල වටකැටියේ වලව්වේ හීන්බණ්ඩා මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බඳු ගැණුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩ දෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස මෙහි උපලේඛනයෙහි දැක්වේ.

නීතිඥ නිලන්ත විජේසිංහ,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2023 ඔක්තෝබර් මස 02 වැනි දින,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ උඩසිය පත්තුව උතුර සුළු කොට්ඨාසයේ කුරුකොහොගම යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මුලික පිඹුරු මහ 1690 දරන පිඹුරේ කැබලි අංක 1 න් නිරූපණය වන මුල්ලපැලේ කුඹුර නැමති කුඹුරු ඉඩමේ අක්කර 01 රූඩ් 2 පර්චස් 00 ක ප්‍රමාණ ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද,


මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය *(සම්බන්ධිතයි)*

II. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර කොට්ඨාසයේ ගම්පහ බටහිර පත්තුව/කෝරළේ හාල්යාල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හාල්යාල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද ග. පි. 427 උධෘත 1 දරන පිඹුරේ කැබලි අංක 152 න් නිරූපණය වන කැලියා ලියද්ද ගොඩගෙදර වත්ත නැමති කුඹුරු ඉඩමේ අක්කර 00 රූඩ් 3 පර්චස් 38 ක ප්‍රමාණ ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද,

III. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර කොට්ඨාසයේ ගන්දෙකේ පත්තුව/කෝරළේ තලගුනේ ග්‍රාම සේවක කොට්ඨාසයේ කිරිගන් කුඹුර ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද ග. පි. 369 උධෘත 1 දරන පිඹුරේ කැබලි අංක 303 න් නිරූපණය වන මීතොට වත්ත නැමති ඉඩමේ අක්කර 33 රූඩ් 1 පර්චස් 26 ක ප්‍රමාණ ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද,

IV. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ ගම්පහ නැගෙනහිර කෝරළේ පිටවල කොට්ඨාස අංක 234 ග්‍රාම සේවක කොට්ඨාසයේ පිටවල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද ග. පි. 376 උධෘත 1 දරන පිඹුරේ කැබලි අංක 273 න් නිරූපණය වන තලපිටිය කුඹුර නැමති කුඹුරු ඉඩමේ අක්කර 00 රූඩ් 3 පර්චස් 10 ක ප්‍රමාණ ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද,

V. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර කොට්ඨාසයේ ගම්පහ බස්නාහිර කෝරළේ හාල්යාල ග්‍රාම සේවක කොට්ඨාසයේ මාඩුගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද ග. පි. 428 උධෘත 1 දරන පිඹුරේ කැබලි අංක 107 හා 237 න් නිරූපණය වන නාරංගහමුලහේන උඩපතනමඩිත්තලගහේන ඇඹිට්ල්ලකැටියහේන මාලිගාගෙදර වත්ත නොහොත් පට්ටිය කුඹුරේ ගෙදරහේන නැමති ඉඩමේ අක්කර 08 රූඩ් 2 පර්චස් 11 ක ප්‍රමාණ ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද වේ.

EOG 10 - 0139

---

| | | |
|---|---|---|
| විශේෂ්‍ය අංකය | : | මහ/10 |
| ව්‍යවස්ථාපිත නිශ්චය අංකය | : | 2713 |
| සංශෝධන අංකය | : | 590 |

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ පළ වූ ව්‍යවස්ථාපිත නිශ්චය අංක 2713 සංශෝධනය කිරීම**

1976 දෙසැම්බර් මස 07 වැනි දිනැති හා අංක 242/2 දරන ශ්‍රී ලංකා ජනරජයේ *(අතිවිශෙෂ) ගැසට්* පත්‍රයේ විශේෂ්‍ය අංක මහ/10 දරන ප්‍රකාශනයට අදාළව පළ වූ ඉහත දැක්වෙන ව්‍යවස්ථාපිත නිශ්චයේ 2 වන උපලේඛනය ඉවත් කර ඉන් කොටසක් සඳහා පහත සඳහන් උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

නීතිඥ නිලන්ත විජේසිංහ,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2023 ඔක්තෝබර් මස 02 වැනි දින,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, වල්ගම් පත්තුව සුළු කොට්ඨාසයේ, වල්ගම ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 149 අතිරේක අංක 5 හි දැක්වෙන වලව්වත්ත නැමති ඉඩමේ නොබෙදූ අක්කර 03 රූඩ් 2 පර්චස් 28 ක ප්‍රමාණ ඇති කැබලි අංක 473 දරන බිම් කැබැල්ල හා එහි තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද වේ.

EOG 10 - 0140

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.